**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2023**

**බදු නීතිය**

**(පැ තුනයි)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07යි**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**
**(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ)**

---

**1.** 'වත්මන් බදුකරණය සඳහා ඇඩම් ස්මිත්ගේ (Adam Smith's) යහපත් බදුකරණ මූලධර්ම (principles of good taxation) ඉතා ප්‍රබල පදනමක් සකසයි.' නමුත් ඒවා සැම විටම අනුගමනය නොකෙරේ. රාජ්‍යය නිලධාරීන්, මහජන මුදල් රැස් කල යුතු ආකාරය සහ වැය කළ යුතු ආකාරය පිළිබඳව එම මූලධර්ම ඇසුරෙන් අදහස් දක්වන්න.

**(ලකුණු 25යි)**

**2.** කවීන්, යූරියා පොහොර ආනයනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක නිරත කොළඹ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකි. ඔහු, ඔහුගේ ව්‍යාපාරික කටයුතු සඳහා නිතර වෙනත් දිස්ත්‍රික්ක වෙත ගමන් කරයි. ඔහු 2010දී, කොළඹ ප්‍රදේශයේ නිවසක් ඉදිකිරීම ආරම්භ කළේය. ඔහු ඉඩම මිලදී ගැනීම සඳහා රු. 20,000,000/- ක් සහ නිවස ඉදිකිරීම සඳහා රු. 10,000,000/-ක් වැය කළේය. 2011දී, නිවසේ ඉදිකිරීම් නිම කරන ලදී. ඔහු 2012දී, ටයිල් ඇතිරීම සඳහා 2,000,000/- ක මුදලක් වැය කළේය. 2013දී, එම ටයිල් ගැලවීමට පටන් ගත් අතර කවීන්, ඒවා අලුත්වැඩියා කිරීම සඳහා 1,000,000/- ක මුදලක් වියදම් කළේය. කවීන්, 2014 සිට 2018 දක්වා කාල වකවානුවේදී නිවසට සහ ඉඩමට අනවසරයෙන් ඇතුල් වී හිමිකම් පෑ පුද්ගලයෙකු ඉන් ඉවත් කිරීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ගොනු කළේය. මෙම නඩු කටයුතු සඳහා ඔහු 3,000,000/- මුදලක් වැය කළේය. කාබනික පොහොර වලට මාරු වීමේ රජයේ ප්‍රතිපත්තිය හේතුවෙන් කවීන් ඔහුගේ රත්නපුර පිහිටි වතුයායට සමීපව මහා පරිමාණ කාබනික පොහොර ගොවිපළක් අලුතින් ඇරඹීමට තීරණය කළේය. කවීන්, මෙම වසර කිහිපය පුරාවටම කොළඹ නිවසේ පදිංචිව සිටියේ 2021 වසර සහ 2022 වසරේ මුල් මාස 10

තුළ පමණි. ඔහු, 2022 නොවැම්බර් මාසයේදී, රත්නපුර පිහිටි ගොඩනැගිල්ලක් වෙනුවට ඔහුගේ කොළඹ පිහිටි ඉඩම සහ නිවස සඳහා හුවමාරු ඔප්පුවක් සකස් කළේය. 2022 වසරේ රත්නපුර ගොඩනැගිල්ලේ සාධාරණ වෙළඳපල වටිනාකම රු. 40,000,000/- ක් විය.

(i) මෙම සිද්ධි දාමය තුළ කවීන්ගේ අදායම් බදු වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

(ii) කවීන් 2021 දී, සිය බිරිඳ ඔහුගේ එකම උරුමක්කාරයා බවට පත් කරමින් අභාවප්‍රාප්ත වූයේ යැයි උපකල්පනය කළහොත් අදායම් බදු වගකීම වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 05යි )

**3.** (අ) සහ (ආ) යන කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) හවුල් ව්‍යාපාර සහ සමාගම් යනු ව්‍යාපාරවල නිරතව සිටින පුද්ගල විශේෂ අතර වඩාත් පොදු ආකාර දෙකකි. ඉහත සඳහන් කරන ලද පුද්ගල විශේෂයන්ට අදාළ වාසිකත්ව සංකල්පය සහ බදු වගකීම පිළිබඳව 2017 අංක 24 දරණ දේශීය අදායම් (සංශෝධිත) පනතේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 12.5යි)

(ආ) ආයෝජන ආදායම සහ ව්‍යාපාර අදායම අතර වෙනස සාකච්ඡා කරන්න, එසේම 2017 අංක 24 දරණ දේශීය අදායම් (සංශෝධිත) පනතට ආයෝජන අදායම ඇතුළත් කිරීමට හේතු වූ කරුණු කෙරෙහි අවධානය යොමුකරමින් ආයෝජන අදායමට අදාළ බදු වගකීම විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 12.5යි)

**4.** වෛද්‍ය ධන්කන් සිල්වා රාගම ශික්ෂණ රෝහලට අනුයුක්තව සේවය කරන අතර මාසික වැටුප ලෙස රු. 700,000/- ක මුදලක් ලබයි. ඔහු, මසක වටිනාකම රු. 60,000/- ක් වන වෛද්‍ය නිල නිවස භාවිතා කරන අතර මාසික ඉන්ධන දීමනාව ලෙස රු. 75,000/- ක් ද ලබයි. ඔහු රාත්‍රී වැඩ මුර සඳහා රු. 300,000/- ක්ද රු. 20,000/- ක රජය විසින් සපයනු ලබන ජීවන වියදම් දීමනාවද ලබයි. ඔහු වෙත පශ්චාත් උපාධිය සඳහා ශිෂ්‍යත්වයක් ලැබුණු අතර එහි වටිනාකම රු. මිලියන 20 කි. මීට මාස තුනකට පෙර, ඔහු ජාතික රෝහලෙන් ඉවත්ව රාගම රෝහලට සම්බන්ධ වන අවස්ථාවේදී ජාතික රෝහල් කාර්ය මණ්ඩලය, ඔහුගේ සේවය අගයමින් ඔහු වෙත රු. 500,000/- ක් වටිනා ත්‍යාගයක් ලබා දුන්නේය. එපමණක් නොව තම පියා විසින් ආරම්භ කරන ලද City

Hospital Pvt Ltd හි අධ්‍යක්ෂවරයෙකුද වන වෛද්‍ය ධන්කන්, සෑම දිනකම සවස 5.00 න් පසු එහි රෝගීන් පරීක්ෂා කරයි. ඒ සඳහා ඔහු මාසිකව 1,500,000/- ක මුදලක් ලබයි. මෙයට අමතරව එම රෝහලේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් මෙම වර්ෂය සඳහා ලාභයෙන් ඔහුගේ කොටස ලෙස රු. 3,000,000/- ක වටිනාකමක් ලබයි. City Hospital, පෞද්ගලික රෝහල් අතර ඵලදායිතාවය මැනීමේ තරගයෙන් ජයග්‍රහණය කල අතර, ඒ සඳහා මුලිකත්වය ගත් වෛද්‍ය ධන්කන් මහතා වෙත රු. 2,500,000/- ක ත්‍යාගයක් පුද්ගලිකව හිමි විය.

2022/2023 තක්සේරු වර්ෂය සඳහා වෛද්‍ය ධන්කන්ගේ අදායම් බදු ප්‍රමාණය ගණනය කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 25යි)

5. 2022/2023 තක්සේරු වර්ෂය සඳහා City Hospital Pvt Ltd පහත වියදම් දැරිය. ඒ අනුව, City Hospital හි අදායම් බදු ගණනය කිරීමේදී එම වියදම්වල අදාළත්වය නෛතික ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය මත පදනම්ව සාකච්ඡා කරන්න.

(අ) නව අධ්‍යක්ෂ මණ්ඩලය, රෝහල් කාර්ය මණ්ඩලය වෙත හඳුන්වාදීම වෙනුවෙන් අරලිය හෝටලයේ පැවති රාත්‍රී සාදය සඳහා රු. 1,500,000/- ක් ;

(ආ) පස් නිවුන් දරු උපතක් සඳහා ඉන්දියාවෙන් ගෙන්වන ලද වෛද්‍ය කණ්ඩායම සඳහා රු. 3,000,000/- ක් ;

(ඇ) රෝහල වෙත අලුතින් මිලදී ගත් හුස්ම ගැනීම පහසු කරවීමේ යන්ත්‍ර (ventilators) සඳහා රු. 2,000,000/- ක් ද හුස්ම ගැනීම පහසු කරවීමේ පැරණි යන්ත්‍ර වෙන්දේසියේදී සිදුවූ අලාභය 1,000,000/- ක්;

(ඈ) රසායනාගාරයේ (laboratory) සහ ශල්‍ය ඒකකයේ (theater) වායු සමීකරණ අලුත්වැඩියා කිරීම සඳහා රු. 500,000/- ක්

(ඉ) වාර්ෂික රෝහල් බලපත්‍රය අලුත් කිරීම සඳහා දරන ලද 200,000/- ක්

(ඊ) රෝහල් ඔසු හල වෙත ඖෂධ මිලදී ගැනීම සහ නව කොරෝනා වෛරස ප්‍රභේදය පිළිබඳව රසායනාගාර පරීක්ෂණ සඳහා රු. 3,000,000/- ක්.

(ලකුණු 25යි)

6. (අ) සහ (ආ) යන **කොටස් දෙකටම** පිළිතුරු සපයන්න.

(අ) දේශීය අදායම් කොමසාරිස් ජෙනරාල්වරයාගේ තීන්දුවකින් අතෘප්තියට පත් බදු ගෙවන්නෙකු වෙත සහන පිරිනැමීමේදී 2017 අංක 24 දරණ දේශීය අදායම් (සංශෝධිත) පනත යටතේ ක්‍රියාත්මක අභියාචනා ක්‍රියාපටිපාටිය පිළිබඳව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15යි)

(ආ) "බදු කරු විසින් බාරදුන් බදු වාර්තා මත සකස් කළ එකක් හෝ තක්සේරුකරු ඔහු වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් ඇස්තමේන්තුගත තක්සේරුවක් මත හෝ තක්සේරුවක් සකස් කර ඇති විටෙක, තක්සේරු කිරීමේ නිල ක්‍රියාව නිවැරදි ලෙස සහ රෙගුලාසි වලට අනුව සකස් කර ඇති බවට බිඳ හෙළිය හැකි පූර්ව නිගමනයක් මතු වෙයි. එබැවින්, බදුකරු එවැනි තක්සේරුවකට එරෙහිව අභියාචනා කරන විට තක්සේරුව ඉවත් කරවා ගැනීමේ වගකීම ඔහු වෙත පැවරෙන අතර එම තක්සේරුව වැරදි සහගත සහ අධි තක්සේරුවක් බවට කොමසාරිස් ජනරාල් තෘප්ත කිරීම ඇරඹීම බදු කරු සිදු කල යුතුයි."

*Guillain v. CIT: CTC 361*

2017 අංක 24 දරණ දේශීය අදායම් (සංශෝධිත) පනතෙහි ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අදාළ නඩු තීන්දු නීතිය ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**(ලකුණු 10යි)**

**7.** (අ) හෝ (ආ) යන <u>**කොටස් දෙකෙන්**</u> <u>**එක් කොටසකට**</u> පමණක් පිළිතුරු සපයන්න.

<u>**එක්කෝ**</u>

(අ) ආර්ථික දෘෂ්ටිකෝණයෙන් බලන විට බදු වැළකීම (tax avoidance) සහ බදු වැලහීම (tax evasion) තුළ අදායම් ලැබීම් අඩුවීම වැනි සමාන බලපෑම් පවතියි. එමෙන්ම මේ දෙකෙන්ම අදහස් කරනු ලබන්නේ බදු බර අඩු කරවා ගැනීමයි. නෛතිකමය වශයෙන් පවතින වෙනස්කම් සහ සදාචාරාත්මක කරුණු හේතුවෙන් මේ දෙක එකිනෙකට වෙනස් සහ අසමාන ලෙස සාධාරණත්වයක් සලසනු ලබන බවට තනි පුද්ගලයින් විසින් සලකනු ලැබීම අපේක්ෂා කෙරේ. සාකච්ඡා කරන්න.

**(ලකුණු 25යි)**

<u>**නැතහොත්**</u>

(ආ) බදු එකතු කිරීමේ හැකියාව සහ රජයේ බදු අදායම ශක්තිමත් කිරීම යන කාරණා සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි සමාජ සේවා, විදුලිය හා මහා මාර්ග වැනි තීරණාත්මක යටිතල පහසුකම් සහ පොදු භාණ්ඩ සඳහා මූල්‍යමය දායකත්වය සැලසීම උදෙසා රටට පවතින හැකියාව වටා කේන්ද්‍ර වේ. එබැවින්, බදු ගෙවන්නන් කෙරෙහි දැඩි බලපෑම් ඇති කළද පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා දේශීය අදායම් කොමසාරිස් ජනරාල් වෙත පවතින අසීමිත බලය සාධාරණය.

2017 අංක 24 දරණ දේශීය අදායම් (සංශෝධිත) පනතෙහි ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අදාළ නඩු තීන්දු නීතිය ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**(ලකුණු 25යි)**

***************************************